# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1655/7 - 2010 මැයි 25 වැනි අඟහරුවාදා - 2010.05.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.–බී. 5/83.

**1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත**

1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනතේ 26 වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද යාපා අබේවර්ධන,
කෘෂිකර්ම අමාත්‍ය.

2010 මැයි මස 07 වැනි දින,
කොළඹ,
කෘෂිකර්ම අමාත්‍යාංශයේ දී ය.

නියෝග

1. මෙම නියෝග 2010 අංක 01 දරන පළිබෝධ නාශක (පළිබෝධ පාලන සේවා) පාලන නියෝග යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි ය.

2. "පළිබෝධ පාලන සේවා" රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් නොමැතිව පළිබෝධ පාලන කටයුතු සිදු නොකළ යුතු ය.

3. පළිබෝධ නාශක පාලන කටයුතු කරගෙන යාමේ බලපත්‍රයක් සඳහා වන සෑම ඉල්ලුම්පත්‍රයක්ම නියමිත ආකෘති පත්‍රයකින් විය යුතු අතර රුපියල් විසිදහසක ගාස්තුවකින් සමන්විත විය යුතු ය.

4. ඉල්ලුම් පත්‍රය සහ ගාස්තුව ලැබුනු පසුව රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ඉල්ලුම්පත්‍රය කමිටුවේ අනුමැතිය සඳහා කමිටුව වෙත භාරදිය යුතු ය.

(2) ඉල්ලුම්පත්‍රයක් කමිටුව වෙත භාරදෙන අවස්ථාවේ දී රෙජිස්ට්‍රාර්වරයා විසින් පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් එයට අදාළ වාර්තාවක් භාරදිය යුතුය :-

(අ) ඉල්ලුම්කරුගේ තාක්ෂණික නිපුනතාවය ;

(ආ) එකී සේවා සැපයීමට ඉල්ලුම්කරු නිසි ආකාරයෙන් සැලසුම් කර සිටින්නේ ද යන්න ;

(ඈ) පළබෝධ නාශක වල විෂ සහිත ස්වභාවය, පළිබෝධ නාශක භාවිතයේ දී පරිහරණයේ දී සහ බැහැර කිරීමේ දී අදාළ වන අවදානම් ස්වභාවය පිළිබඳ ඉල්ලුම්කරු දැනුවත් ද යන්න පිළබඳව.

(3) (2) වන නියෝගයේ (අ), (ආ), (ඇ) ඡේදවල දක්වා ඇති කරුණු ඉදිරිපත් කර නොමැති බව විශ්වාස කිරීමට තමාට හේතු ඇති අවස්ථාවක දී රෙජිස්ට්‍රාර්වරයා විසින් බලපත්‍රයක් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කළ හැකි ය. බලපත්‍රයක් ප්‍රතික්ෂේප කරන අවස්ථාවක දී රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ප්‍රතික්ෂේප කිරීමට හේතු ඉල්ලුම්කරු වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

5. සෑම බලපත්‍රයක් ම —

(අ) අවුරුද්දක කාලසීමාවක් සඳහා වලංගු විය යුතු අතර පවතින බලපත්‍රය ඉකුත් වීමට මාස තුනකට පෙරාතුව රුපියල් පන්දහසක අළුත් කිරීමේ ගාස්තු ඇතුළුව ඉල්ලා ඇති නියමිත ආකෘති පත්‍රයේ තත්කාර්යය සඳහා ඉල්ලුම්පත්‍රයක් භාරදීමෙන් පසුව බලපත්‍රය අළුත් කරනු ලැබිය හැකි ය ;

(ආ) බලපත්‍රය දරන්නාට කරගෙන යාමට බලය දියයුතු අනුමත කළ වැඩ කොටස් නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය ;

(ඇ) ලියාපදිංචි කරන ලද ව්‍යාපාරික ස්ථානය සහ පළිබෝධ නාශක ගබඩා කර තබන පරිශ්‍රයන් නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය ; සහ

(ඈ) පළිබෝධ නාශක බහාලුමේ ඇලවිය යුතු ලේබලයේ නිශ්චිතව සඳහන් කර ඇති පරිදි ලියාපදිංචි කරන ලද පළිබෝධ නාශක භාවිතා කිරීමට බලය දිය යුතු ය.

6. බලපත්‍ර ලාභියකු විසින් —

(අ) පළිබෝධ නාශක මිලදී ගැනීම පිළිබඳ, භාවිත කරන ලද ප්‍රමාණය පිළිබඳ සහ විනාශ කිරීමට අරමුණු කරන පළිබෝධයන් පිළිබඳ වසර පහක කාලසීමාවක් සඳහා වාර්තා තබා ගත යුතු අතර, අවශ්‍ය වන අවස්ථාවල දී පරීක්ෂා කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා හෝ වෙනත් යම් බලයලත් නිලධරයකුට ඒවා ලබා ගැනීමට සැලැස්විය යුතු ය ;

(ආ) කාර්යය මණ්ඩලය විසින් ආරක්ෂිත පියවර පිළිපදින බවට සහ ප්‍රවාහනයේ දී, ගබඩා කිරීමේ දී සහ පරිහරණයේදී ප්‍රමාණවත් අනතුරු ඇඟවීමේ සංඥා ප්‍රදර්ශනය කරන බවට සහතික විය යුතු ය ;

(ඇ) පළිබෝධ නාශක පරිහරණයේ දී, ප්‍රවාහනයේ දී, ගබඩා කිරීමේ දී සහ බැහැර කිරීමේ දී කාර්යය මණ්ඩලය විසින් ආරක්ෂිත ආවරණ සහ උපකරණ භාවිතා කරන බවට සහතික විය යුතු ය ;

(ඈ) ආරක්ෂිත ඇඟලුම් සහ උපකරණ නිසි ලෙස නඩත්තු කරන බවට සහ හානිවීමක් සොයාගනු ලැබුව හොත් එය ඉක්මණින් අළුත්වැඩියා කරන බවට සහතික විය යුතු ය ;

(ඉ) අවම වශයෙන් වසරකට වරක්වත් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයෙකු විසින් පවත්වනු ලබන පූර්ණ සෞඛ්‍ය පරීක්ෂාවකට යටත්වන ලෙසට කාර්ය මණ්ඩලයට නියම කර ඇති බවට සහතික විය යුතු අතර රෙජිස්ට්‍රාර්වරයා හෝ යම් බලයලත් නිලධරයකු විසින් පරීක්ෂා කිරීම සඳහා ඒ වාර්තා පවත්වාගෙන යා යුතු ය ;

(ඊ) සේවා නියුක්තිකයන්ට වාර්ෂිකව පුහුණුවක් ලබාදිය යුතු අතර පළිබෝධ නාශක වල අන්තරායකාරි ස්වභාවය පිළිබඳ සහ පුද්ගලයකුගේ සෞඛ්‍යයට සහ පරිසරයට ඇති අන්තරාදායක බව පිළිබඳ ඔවුන්ට දැනුම් දිය යුතු අතර සියළු අවස්ථාවන්හි දී ආරක්ෂාව සහතික කිරීමට පිළිපැදීමට අවශ්‍ය කරන පියවර පිළිබඳ ඔවුන් දැනුවත් කළ යුතු ය ;

7. යම් බලයලත් නිලධරයකු විසින් දවසේ සියළු සාධාරණ වේලාවන්හි දී පූර්ව දැනුම් දීමකින් පසු පළිබෝධ පාලන කටයුතු කරගෙන යන ස්ථානයකට හෝ පළිබෝධ පාලන සේවා දේපලක් පවතින ස්ථානයක ඇති යම් රාජ්‍ය හෝ පෞද්ගලික පරිශ්‍රයන්ට ඇතුළු වී පහත දැක්වෙන කරුණු පරීක්ෂා කිරීම සහ විමර්ශනය කිරීම සිදුකළ හැකි ය.

(අ) යම් තැනැත්තකු විසින් මේ පනතේ විධිවිධාන කිසිවක් උල්ලංඝනය කර ඇති ද හෝ උල්ලංඝනය කරන්නේ ද යන්න විමසා බැලීමට ;

(ආ) පළිබෝධ නාශක භාවිතය හෝ අදාළ කර ගැනීම පරීක්ෂා කිරීමට හෝ විමර්ශනය කිරීමට ;

(ඇ) පළිබෝධ නාශක පාලනයට භාවිතා කරන යම් උපකරණ හෝ යන්ත්‍ර පරීක්ෂා කිරීමට ;

(ඈ) පළිබෝධ නාශක කිසිවක් ගබඩා කර තබන හෝ බැහැර කරන ස්ථාන පරීක්ෂා කිරීමට ;

(ඉ) පළිබෝධ නාශක හේතුවෙන් මනුෂ්‍යයන්ට සිදු වන හානි සහ යම් දේපලකට හෝ පරිසරයට සිදු වූ අලාභ පිළිබඳ පැමිණිලි පරීක්ෂා කිරීමට සහ විමර්ෂන පැවැත්වීමට ;

(ඊ) පළිබෝධ නාශකවල නියැදි ලබා ගැනීමට ;

(උ) (i) නියමිත කාර්යයන් සඳහා භාවිතා කිරීමට නුසුදුසු පළිබෝධ නාශක කිසිවක් ;

(ii) ඔවුන් විසින් කරගෙන යන්නා වූ පළිබෝධ පාලන කටයුතු වලට අදාළවන යම් උපකරණ, ලේඛන, වාර්තා, ඉන්වොයිස් හෝ වෙනත් ලේඛන ;

තහනමට ගැනීමට හෝ රඳවා තබා ගැනීමට හෝ ඉවත් කිරීමට.

8. බලපත්‍ර ලාභියා —

(අ) බලපත්‍රයේ කොන්දේසිවලට අනුකූල වීම පැහැර හරින, ප්‍රතික්ෂේප කරන හෝ අතපසු කරන ; හෝ

(ආ) අසත්‍ය හිමිකම් පෑම් හෝ වාර්තා ඉදිරිපත් කරන ; හෝ

(ඇ) මේ පනතේ යම් නියෝගයක් හෝ විධිවිධාන කිසිවක් උල්ලංඝනය කරන අවස්ථාවකදී

රෙජිස්ට්‍රාර්වරයා විසින් "කමිටුව" විමසා-

(I) සාධාරණ කාලයක් තුළ දී බලපත්‍රලාභියාට හේතු දැක්වීමට හෝ ප්‍රකාශිත කරුණු පැහැදිලි කිරීමට නියම කරමින් බලපත්‍රලාභියාට ලිඛිත අවවාදයක් නිකුත් කිරීම ;

(II) සාධාරණ හේතු මත බලපත්‍රය අත්හිටුවීම ;

(III) බලපත්‍රය අළුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම ;

(IV) බලපත්‍රය අවලංගු කිරීම

සිදුකළ යුතු ය.

9. මෙම නියෝග ක්‍රියාත්මක වන දින පළිබෝධ පාලන සේවා කරගෙන යන යම් තැනැත්තකු මෙම නියෝග ක්‍රියාත්මක වන දින සිට මාස දොළහක කාලයක් ඇතුළත මෙම නියෝගවලට අනුකූලව බලපත්‍රයක් ලබාගත යුතු ය.

10. රෙජිස්ට්‍රාර්වරයා විසින් බලපත්‍ර දරන්නාගේ නම සහ ලිපිනය, බලපත්‍ර වලංගු වන කාලසීමාව ආදී තොරතුරු සමග බලපත්‍ර සියල්ලේම රෙජිස්ටරයක් පවත්නා ගෙන යා යුතු ය.

11. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අදහස් වන්නේ නම් මිස –

"පනත" යන්නෙන් 1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත අදහස් වේ.

"පළිබෝධ පාලන සේවා" යන්නෙන් යම් තැනැත්තකු විසින් –

(අ) ධූමකාරක ඇතුළත් සීමා කරන ලද පළිබෝධ නාශක භාවිත කරමින් ; හෝ

(ආ) ධූමකාරක ඇතුළත් පළිබෝධ නාශක භාවිත කරමින් ; හෝ

(ඇ) සීමා කරන ලද පළිබෝධ නාශක හැර වෙනත් පළිබෝධ නාශක භාවිත කරමින්

කරගෙන යන පළිබෝධ පාලන කාර්යයන් අදහස් වේ.

"කමිටුව" යන්නෙන් 1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත යටතේ පිහිටුවන ලද පළිබෝධ නාශක තාක්ෂණික හා උපදේශන කමිටුව අදහස් වේ.

"රෙජිස්ට්‍රාර්" යන්නෙන් 1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත යටතේ පත් කරන ලද රෙජිස්ට්‍රාර්වරයකු අදහස් වේ.

6-183

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.